වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව.
පුත්තලම දිස්ත්‍රික්කය
----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිගේ වාර්තාව 2014 දෙසැම්බර් 10 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට වනාතවිල්ලුව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

2013 දෙසැම්බර් 31 දිනට තිබූ රු.44,949 ක් වටිනා විදුලි උපකරණ ගබඩා තොග ශේෂය ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

පොදු තැන්පත්, සේවක ණය හා බලපත්‍ර ගාස්තු යන ගිණුම් විෂයයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු. 5,808,301 ක් වුවද උපයෝගී ලේඛණ අනුව එම එකතුව රු. 5,164,901 ක් වීම නිසා රු. 643,400 ක නොසැසඳුන වෙනසක් අනාවරණය විය.

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.14,175,245 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 15,680,811 ක් විය.

(ආ) 2010 මැයි 13 දිනැති අංක 5/3 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව කල් ඉකුත් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් රු. 1,133,863 ක් ආදායමට ගෙන නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 53,882,825 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,932,201 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,016,636 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (අ) | වරිපනම් හා බදු | 706 | 566 | 1,116 |
| (ආ) | බදු කුලී | 1,299 | 1,096 | 246 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | -- | 202 | -- |
| (ඈ) | සේවා සඳහා ගාස්තු | 369 | 369 | -- |
| (ඉ) | වරෙන්තු ගාස්තු හා දඩ | 2,599 | 1,823 | 776 |
| (ඊ) | වෙනත් ආදායම් | 2,220 | 1,157 | 2,863 |

### 2.2.2 වරිපනම් හා බදු

වරිපනම් බදු සහ අක්කර බදු වල අවුරුදු 1 කට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබූ හිඟ ශේෂය, 2013 දෙසැම්බර් 31 දිනට තිබූ මුළු හිඟ මුදලේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 85 ක් සහ සියයට 84 ක් විය. තවද, 2013 වර්ෂයට අදාළව ජල බදු අයවීමේ දුර්වල ප්‍රගතියක් දක්නට ලැබුණි.

### 2.2.3 බදු කුලී

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ බදුකුලී මුදල රු.29,583 ක් වූ අතර, එම මුදලින් රු.19,333 ක් සමාලෝචිත වර්ෂයට අදාල විය.

2.2.4 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | | රු. |
|---|---|---|---|
| | | | ----- |
| (i). | උසාවි දඩ | - | 775,782 |
| (ii). | මුද්දර ගාස්තු | - | 2,863,000 |

2.3 අධිභාර

---------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉදිරියේදී රු. 43,341 ක් සම්බන්ධයෙන් අධිභාර පියවර ගැනීමට යෝජිතව ඇත.

2.4 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත සම්පත්**

-----------------------------------------

රු. 676,000 ක් වූ වත්කම් වසර 2 සිට වසර 5 දක්වා කාලයක් තුළ නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව තිබුණි.

2.5 **හඳුනාගත් අලාභ**

------------------

සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු සේවක ණය රු.799,797 කින් රු.20,950 ක් වර්ෂ ගණනාවක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

**2.6** **අයවැය පාලනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ අයවැය ලේඛනය මගින් රු.36,937,746 ක් ඇස්තමේන්තු කරන ලද ආදායම් විෂයයන් 11 කට අදාලව කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි.

(ආ) ඇස්තමේන්තු සකස් කිරීමේ දී පෙර වර්ෂවල ඇස්තමේන්තුගත දත්තයන්, අත්දැකීම්, දරා ඇති සත්‍ය වියදම්, උපයාගෙන ඇති ආදායම් ආදිය නොසලකා අයවැය ලේඛණය පිළියෙල කර තිබුණි.

**3.** **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරවනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ගබඩා පාලනය

(ඈ) අයවැය පාලනය